# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 159/9 — 1975 අප්‍රේල් 18 වැනි සිකුරාදා — 1975.04.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් කරන ප්‍රකාශන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(50)/75.

### ජනාධිපතිතුමාණන් විසින් කරනු ලබන ප්‍රකාශනය

(මුද්‍රාව)

වි. ගොපල්ලව.

ශ්‍රී ලංකාවෙහි මහාජන හදිසි තත්ත්වයක් පැවතීම හේතුකොටගෙන, මහාජන ආරක්ෂාව, මහාජන සාමය සුරක්ෂිත කිරීම හා මහාජන ජීවිතයට අත්‍යවශ්‍ය වූ සැපයීම් හා සේවාවන් ද පවත්වාගෙන යාම සඳහා එසේ කිරීම අවස්ථානුකූල යයි මා අදහස් කරන හෙයින් :

ජනාධිපතිවර විලියම් ගොපල්ලව වන මම, 1959 අංක 8 දරන පනතින් සංශෝධනය කරනු ලැබූ (40 වෙනි අධිකාරය වන) මහාජන ආරක්ෂක ආඥාපනතේ 2 වෙනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර ඒ ආඥාපනතේ II කොටසේ විධිවිධාන, ශ්‍රී ලංකාව මුළුල්ලේම එක් දහස් නවසිය හැත්තෑ පහක් වූ අප්‍රේල් මස දහනව වැනි දින ක්‍රියාත්මක විය යුතු බව මේ ප්‍රකාශනයෙන් ප්‍රකාශ කරමි.

වර්ෂ එක් දහස් නවසිය හැත්තෑ පහක් වූ අප්‍රේල් මස දහඅට වැනි දින නුවර එළියේ දී අත්සන් කර දෙන ලදී.

;තුමාණන් වහන්සේගේ අණ පරිදි,

එච්. සී. ඩී. විජේසිංහ,
ජනාධිපතිතුමාගේ ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

1A—ඊ 13536—2,100 (75/04)